# චිරන්තන

## ඓතිහාසික අධ්‍යයන සඟරාව

### අංක 4

# දූර ගමනක ආරම්භය : ඒ. ආර්. අයර්ටන් (1912-1914)

අනුර මනතුංග

එච්.සී.පී. බෙල්ට පසුව පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් පත්වූයේ ඒ.ආර්.අයර්ටන්ය. ඔහු දක්ෂ, තරුණ පුරාවිද්‍යාඥයකු වූ අතර ක්‍රමානුකූල සැලැස්මක් මත මෙරට පුරාවිද්‍යා පර්යේෂණ කටයුතුවලට අවතීර්ණ විය. එහෙත් අවාසනාවන්ත ලෙස අකල් මරණයකට ගොදුරුවීම නිසා මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඔහුගෙන් ලැබුණු සේවය වර්ෂ එකහමාරකට පමණ සීමා විය. එය ඉතා කෙටි කාලයක් වුවත් ශ්‍රී ලංකා පුරාවිද්‍යා පර්යේෂණ ඉතිහාසය තුළ එය එක් සුවිශේෂ කාලපරිච්ඡේදයක් ලෙස සනිටුහන් කළ හැකිය.

සහකාර පුරාවිද්‍යා කොමසාරිස් ලෙස කටයුතු කළ ජෝන් ස්ටිල් 1908 දී සිය තනතුරෙන් ඉල්ලා අස්වීම නිසා එච්.සී.පී.බෙල්ට පසුව පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත් කරනු ලබන්නේ කවුරුන්ද යන්න ලංකාණ්ඩුවේ බලධාරීන්ට ගැටලුවක් විය. ඒ සඳහා ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණයේ නිලධාරියෙකු ලබා දෙන ලෙස ලංකාණ්ඩුකාර මැකලම් විසින් ඉල්ලීමක් කරන ලද නමුත්, තම කණ්ඩායමේ කිසිවෙකු නිදහස් කිරීමට එහි ප්‍රධානියා වූ ජෝන් මාෂල් කැමති නොවීය. ඒ වෙනුවට ඔහු යෝජනා කළේ එක්කෝ පළපුරුදු පුරා විද්‍යාඥයෙකු සොයාගෙන ඔහුට දේශීය භාෂාවන් පිළිබඳ පුහුණුවක් ලබාදෙන ලෙස හෝ නැතහොත් භාෂා විශේෂඥයෙකු තෝරාගෙන ඔහුට පුරාවිද්‍යා දැනුමක් ලබාදී මෙම තනතුරට බඳවා ගන්නා ලෙසය.

බෙල් මේ සම්බන්ධව දැරුවේ මීට වෙනස් අදහසකි. උක්ත තනතුරට පත්වන්නා පළමුව දේශීය තත්ත්වයන් පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයෙකු විය යුතු බවත් විශ්වාස කළ බෙල් තම අනුප්‍රාප්තිකයා ලෙස සිවිල් නිලධාරියෙකු වූ එච්. ඩබ්ලිව්.කොඩ්රින්ටන් ගේ නම යෝජනා කළේය. මැකලම් ආණ්ඩුකාරයා ද එම යෝජනාවට කැමති වූ නමුත් යටත් විජිත භාර ලේකම් වරයා වූ ක්‍රීවේ ස්වාමිවරයා ඊට එකඟ නොවීය. ඔහු දැඩි ලෙස විශ්වාස කළේ ලංකාවේ ඊළඟ පුරාවිද්‍යා කොමසාරිස්වරයා පුහුණු වෘත්තීය පුරාවිද්‍යාඥයෙකු විය යුතු බවය.